

# මහින්ද මෙන්ම සන්ධානයද පරාජය කළ යුතුය

## “අපි දැන් කුමක් කරමුද?”

ජනවාරි 08 වෙනිදා ඡන්ද පොලට ගොස් විපක්ෂයේ පොදු අපේක්ෂක මෛත්‍රීපාල සිරිසේනගේ නම සහ හංසයා ලකුණ ඉදිරියෙන් කතිරය ගැසූ මේ රටේ හැටහතර ලක්ෂ දාහත් දහසක් වන ජනතාව අද වෙන විට එකිනෙකා හමුව මුමුණන ප්‍රශ්ණය බවට පත්ව ඇත්තේ එයයි. හේතුව ඔවුන්ගෙන් මෛත්‍රීපාල සිරිසේනට ලැබුණු ජනවරම පරාජිත මහින්ද රාජපක්ෂගේ ගෝල බාලයන් ප්‍රමුඛ මජර දේශපාලක කල්ලිය විසින් නිර්ලජ්ජිත ආකාරයෙන් කොල්ල කන ලද බැවිනි.

ජනවාරි 08 වෙනිදා හැට හතර ලක්ෂ දාහත් දහසක් දෙනා මෛත්‍රීපාල සිරිසේන පොදු අපේක්ෂකයා වෙනුවෙන් සිය ඡන්දය පාවිච්චි කළේ විශේෂ අරමුණක් වෙනුවෙනි. එය අනෙකක් නොව තිස් වසරක් තිස්සේ රටේ දේශපාලන දේහයේ බරපතල විකෘති කිරීම් ඇති කිරීමට බලපෑ විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීමය. මහින්ද රාජපක්ෂ පරාජය කිරීමට විපක්ෂයේ පොදු අපේක්ෂකයෙක් ඉදිරිපත් කිරීමේ වැඩ පිළිවෙළ පූර්ණ වශයෙන් ගොණු වූයේ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමේ සටන් පාඨය මුල් කරගනිමිනි. රටේ පවත්නා වත්මන් දේශපාලන සංස්කෘතියේ වෙනසක් ඇති කිරීම සඳහා ඉවහල් වන සෙසු ව්‍යවස්ථා සංශෝධන එයට ඇතුළත් කෙරුණේ ද්විතීයවය. මේ සමස්ථය දින 100 වැඩ සටහනකට ගොණුවී එයට හුදී ජන පහන් සංවේගය සඳහා වන කඩිනම් පාරිභෝගිකවාදී සහන ඇතුළත් කෙරුණේ අවසානයටය.

එම වැඩපිළිවෙළ සිවිල් සමාජය සහ දේශපාලන සංස්කෘතියේ වෙනසක් අපේක්ෂා කළ දේශපාලන පක්ෂ විසින් ඉදිරියට ගෙන යමින් සිටින අතර පොදු අපේක්ෂකයා ලෙස මෛත්‍රීපාල සිරිසේන එහි නියමුවා බවට පත්වන්නේ අනපේක්ෂිත ලෙස හදිසියේය. අනතුරුව ඔහු ජනතා සටන් පාඨය ඔසවා ජනතාවට පෙන්වමින් ජනවරමක් ඉල්ලා සිටියේ ඒ සටන් පාඨය ජයග්‍රහණය කරවීමටය. ඉන් පසුව මෛත්‍රීගේ වේදිකාවට නැගි යම් දේශපාලන පක්ෂ වීද ඒ පක්ෂද ජනතාව ඉදිරියේ පෙනී සිටියේ ඒ ජනතා සටන් පාඨය ජයග්‍රහණය කරවීම වෙනුවෙනි. මෛත්‍රීපාල සිරිසේනට ජනවාරි 08 වෙනිදා ජනවරම ලැබෙන්නේත් ඒ වෙනුවෙනි. ජනවරම ලැබීමෙන් පසු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන විසින් පිහිටුවන ලද අලුත් ආණ්ඩුව පොරොන්දු ඉටු කිරීම පටන් ගන්නේ පොරොන්දු පත්‍රය ඔලුවෙන් සිටුවමිනි. එහිදී මුලින්ම ඉටු කෙරෙන්නේ පාරිභෝගිකවාදී ජනතා සහන සඳහා ආණ්ඩුව ලබාදුන් පොරොන්දුය. පොරොන්දු වූ ලෙසම නොවෙතත් ඉන්ධන මිල අඩු කිරීම, බස් ගාස්තු පහළ හෙළීම, අතුරු අය-වැයක් මගින් ප්‍රකාශයට පත් කළ ජනතා සහන ආදිය ජනතාවට ලැබෙන්නේ ඒ අනුවය. එහෙත් එහිදීද රජයේ සේවක වැටුප් වැඩි කිරීම, විශ්‍රාමික දීමනා ආදී කරුණුවලදී අලුත් ආණ්ඩුව කටයුතු කරනු ලැබුවේද මහින්ද රාජපක්ෂ ආණ්ඩුවේ පිළිවෙතට අනුවම ජනතාව රවටන ආකාරයෙනි.

දෙවනුව ආණ්ඩුව අත ගසන්නේ නව දේශපාලන සංස්කෘතියක් සඳහා වන ප්‍රතිසංස්කරණවලටය. ‘දින 100’ ආයු සංස්කරණය අවසන්වන තෙක්ම එහිලා වන එකදු වැදගත් වෙනස්කමක් හෝ කරන්නට ආණ්ඩුව අපොහොසත් විය.

ජනාධිපතිවරණයේදී ලද ජනවරමේ මූලිකම අංගය වන විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීමේ කටයුත්තට ආණ්ඩුව අතගසන්නේ දින 100 අවසාන අදියරේදීය. ඒ වන විට ජනතාවට ඉදිරිපත් කළ පොරොන්දු පත්‍රයේ ඒ සම්බන්ධයෙන් සඳහන්ව තිබුණු වගන්තිය අලුත් ආණ්ඩුවේ සුළුතරයක අවශ්‍යතාව අනුව අර්ථ නිරූපනයක් මගින් සංශෝධනය කරගන්නට ආණ්ඩුවට සිදුවී තිබුණි. ජනාධිපති මෛත්‍රීපාල සිරිසේනගේ දේශපාලන භූමිකාව පිළිබඳවද බලවත් සැකයක් ඇති කරනු ලැබූ එම සංශෝධනය වූයේ ජනවරමට අදාළ විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීම, විධායක ජනාධිපති ධුරයේ බලතල කප්පාදුවකට පමණක් සීමා කිරීමය.

දින 100 වැඩසටහනේ අවසාන කාලය එළැඹෙන විට මේ වගන්තියට ආණ්ඩුවේම කොටස්කාර පක්ෂයක් වන ජාතික හෙළ උරුමය පක්ෂය අලුත් අර්ථ නිරූපනයක් ලබාදී තිබුණි. ඉන් කියැවුණේ විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීමේ පොරොන්දුවක් මෛත්‍රීපාල සිරිසේනගේ මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශයේ නොමැති බවය. ජනමත විචාරණයකට තුඩුදිය හැකි කිසිවක්ම සිදු නොකරන බව මැතිවරණ ප්‍රකාශනයේ පැහැදිලිවම දක්වා ඇති බවය. ඒ අනුව සිදුකළ යුත්තේද, සිදුකළ හැක්කේද විධායක ජනාධිපති ධුරයේ යම් යම් බලතල කප්පාදුවක් පමණකි. සිය පක්ෂයේ ස්ථාවරය ලෙස හෙළ උරුමය සපයන ලද මේ අර්ථ නිරූපනය ආණ්ඩුවේ මතය නොවුණත් මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයා සිටියේද ඒ ස්ථාවරයේ බව පැහැදිලි විය. එහෙත් එම ස්ථාවරය තමන්ට ලැබුණු ජනවරමට පටහැනි බැවින් ජනාධිපතිවරයා රට තුළදී එතරම් ඒ ගැන කතා කළේ නැත. එහෙත් පිටරටවලදී කතා කළේය.

ඉකුත් මාර්තු 24වෙනිදා 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කෙරෙන්නේ මේ පසුබිම තුළය. විධායක ජනාධිපති ධුරයට අදාළ සංශෝධනද ඇතුළත් කොට දින 100 වැඩ සටහන තුළ ඇතුළත් වූ අතිශය වැදගත් දේශපාලන වෙනස්කම් කීපයක් සඳහා වන තවත් සංශෝධනද ඊට ඇතුළත් කොට තිබිණ. අගමැති රනිල් වික්‍රමසිංහ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ එම කෙටුම්පත මගින් ජනාධිපතිවරයාගේ විධායක බලය පාර්ලිමේන්තුවට පවරා තිබිණ.

**එහෙත් අප්‍රෙල් 28 වෙනිදා පාර්ලිමේන්තුවේ සම්මත වූයේ එම කෙටුම්පත නොව මජර දේශපාලනයේ යෙදී සිටින අවස්ථාවාදී දේශපාලක කල්ලියේ වුවමනා එපාකම් අනුව ‘සෝදා කපා කොටා තෙලේද බදින ලද’ කෙටුම්පතකි.** ජනවරම සමග සසඳීමේදී එහි තත්ත්වය පැහැදිලි කරගැනීමට කදිම උපමාව ඉදිරිපත් කළේ විමල් වීරවංශය. ඔහු කීවේ නයෙක් ගැන කතා කොට ගැරඬියෙක් සම්මත කරගත් බවය. පෙරටුගාමී සමාජවාදී පක්ෂයේ අජිත් කුමාර මන්ත්‍රීරයා විවාදයේ කළ කතාවේදී දැක්වූ උපමාවද සැබෑව සංඛේතවත් කරයි. ඔහු කීවේ ‘අශ්වයෙක් ගැන කතා කර බූරුවෙක් ගෙනා’ බවකි.

**ජන වරමේ ‘කඟවේනා’ ‘අශ්වයෙක්’ බවට පත් කරන ලද්දේත් ඒ ‘අශ්වයා’ නැවත ‘බූරුවෙක්’ බවට පත් කරන ලද්දේත් ජනතා නියෝජිතයන් ලෙස පෙනී සිටින දේශපාලන තක්කඩියන් රංචුවක් විසිනි.** ඔවුන් සිදු කළ දේ ඔවුන්ගේ වචනයෙන්ම ප්‍රකාශයට පත්ව ඇති බැවින් නැවත සඳහන් කළ යුතු නැත. ඔවුහු ඒ දේ කළේ ජනතාව වෙනුවෙන් නොව සිය බඩගෝස්තරවාදී තක්කඩි අවශ්‍යතාවන් මතය. එසේනම් අපි තේරුම්ගත යුත්තේ ජන වරම ක්‍රියාත්මක කරගන්නට මේ බඩගෝස්තරවාදී තක්කඩියන් පරාජය කිරීම කළ යුතුම බවය. ඒ සඳහා ඉදිරි පාර්ලිමේන්තු මැතිවරණය යොදාගත යුතුව ඇත.

ජන වරම පරාජය කළ දේශපාලන තක්කඩියන්ගෙන් බහුතරයක් වත්මන් විපක්ෂය නියෝජනය කරන්නන්ය. ඉන්



ශ්‍රීලාල් සෙනෙවිරත්න

වැඩි කොටසක් පරාජිත මහින්ද රාජපක්ෂගේ අනුගාමික සහචරයන්ය. එක්සත් ජනතා නිදහස් සන්ධානය නමැති දේශපාලන හවුලේ සාමාජිකයන්ය. සුළු කොටසක් වත්මන් ආණ්ඩු පක්ෂයේම සාමාජිකයන්ය. කවර පක්ෂයක් නියෝජනය කළද මේ සියලු දෙනා ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන අවකාශයක සැබෑ ජනතා නියෝජිතයන් නොව අංක එකේ දේශපාලන තක්කඩියන්ය. මේ දේශපාලන තක්කඩි සාමූහිකයේ එක් එක් සාමාජිකයාගේ නමින් ඔවුන්ගේ දේශපාලන තක්කඩිභාවයන් ජනතාවට හෙළිදරව් කොට ඔවුන් පාර්ලිමේන්තුවෙන් අතුගා දැමීමේ දැවැන්ත ශ්‍රමදාන ව්‍යාපාරයකට ජනතාව මේ මොහොතේ ගොණු විය යුතුය.

ජනවාරි 08වෙනිදා ප්‍රකාශයට පත් ජනතා අභිලාෂය ඉටු කරගැනීම සඳහා, රට නව දේශපාලන සංස්කෘතියක් කරා ගෙනයාම සඳහා මහ මැතිවරණයේදී ජනතාව කුමක් කළ යුතුද? මේ වන විට පක්ෂ විපක්ෂ දේශපාලන පක්ෂ සැළසුම් සකස් කරමින් සිටින්නේ පාර්ලිමේන්තු මැතිවරණයේදී සිය බලය තහවුරු කරගන්නා ආකාරය පිළිබඳවය. 19 වෙනි සංශෝධනයට එරෙහිව ප්‍රබලම බලපෑම සිදුකරමින් සිටින්නේ පරාජිත මහින්ද රාජපක්ෂගේ අනුගාමිකයන් බහුතරයක් සිටින එක්සත් ජනතා නිදහස් සන්ධානයයි. දැනට එහි නායකත්වය ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන විසින් දරනු ලැබුවද ඔහුට ලැබුණු ජනවරම දිශාවට සන්ධානය හැසිරවීමේ හැකියාවක් ඔහු සතුව තිබේද? ඔහු ඒ සඳහා යම් ක්‍රමවේදයක් අනුගමනය කරමින් සිටින්නේද

**13 වන පිටට**

## සන්නස Cartoon by PK

